රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
அரசாங்க நிர்வாக மற்றும் உள்நாட்டலுவல்கள் அமைச்சு
Ministry of Public Administration and Home Affairs

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07. சுதந்திர சதுக்கம், கொழும்பு 07. Independence square - Colombo 7.

| දුරකථන / தொலைபேசி / Tel | ෆැක්ස් / பெக்ஸ் / Fax | ඊ මේල් / இ-தபால் / E- mail | වෙබ් අඩවිය / இணையத்தளம் / Web site |
|---|---|---|---|
| (94)011-2696211-13 | (94)011-2695279 | secretary@pubad.gov.lk | www.pubad.gov.lk |

| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date |
|---|---|---|
| CS/SLAS/AMEN/MINUT (II) වෙළුම | | 2014.03.17 |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

දිස්ත්‍රික් ලේකම්වරුන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

**2012.07.01 හා 2015.01.01 අතර කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගනු ලැබූ /ලබන නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම සඳහා පෙනී සිටීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ පහත සඳහන් පරිදි වන බව කාරුණිකව දන්වා සිටිමි.

I. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 2005 සේවා ව්‍යවස්ථාව යටතේ "සමාජ විද්‍යාව" හෝ "ආර්ථික විද්‍යාව" සම්පූර්ණ කර ඇති නිලධාරීන් 2012 සේවා ව්‍යවස්ථාව යටතේ "ආර්ථික හා සමාජ විද්‍යාව" විෂයය සම්පූර්ණ කර ඇති සේ සැලකීමට.

II. 2005 සේවා ව්‍යවස්ථාවෙහි දෙවන කාර්යක්ෂමතා කඩඉමට ඇතුළත් "රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය" විෂයය සම්පූර්ණ කර ඇති නිලධාරීන් 2012 සේවා ව්‍යවස්ථාවෙහි පළමු කාර්යක්ෂමතා කඩඉමට ඇතුළත් "රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය" විෂයය සම්පූර්ණ කර ඇති සේ සැලකීමට.

III. පරිවාස කාලය තුළ "රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය"/ "රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය" සම්පූර්ණ කිරීමට නොහැකි වන නිලධාරීන් හට සහන කාලයක් ලබා දීම සම්බන්ධව එම එක් එක් ඉල්ලීම වෙන් වෙන් වශයෙන් සලකා බැලීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු බව.

IV. 2012.07.01 දිනෙන් පසු බඳවා ගනු ලැබූ/ලබන නිලධාරීන් පළමු කාර්යක්ෂමතා කඩඉම සඳහා "ඉංග්‍රීසි" විෂයය සම්පූර්ණ කිරීමට අවශ්‍ය නොවන අතර, 2014.12.31 දක්වා පවත්වනු ලබන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙහි "ඉංග්‍රීසි" විෂයය සම්පූර්ණ කරන ලද නිලධාරීන් 2012 සේවා ව්‍යවස්ථාවෙහි දෙවන කාර්යක්ෂමතා කඩඉමෙහි "සන්ධාන භාෂා ප්‍රවීණතාවය" සම්පූර්ණ කර ඇති සේ සැලකීමට.

02. මේ සම්බන්ධයෙන් අදාළ සියළු නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

පී.බී. අබේකෝන්
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

පිටපත්:

1. ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අභ්‍යන්තර පාලන) - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පුහුණුව ලබන සියළු ආධුනික නිලධාරීන් දැනුවත් කිරීම සඳහා
2. අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය - අ.ක.ස